**2022 මාර්තු**
**ජනතා විමුක්ති පෙරමුණේ**
**අධ්‍යාපන අංශයේ ප්‍රකාශනයකි.**

# විමර්ශන

**ලෝකය වෙනස් කිරීමට වෙනස් වෙමු!**

# ආනයන - අපනයන හා ශ්‍රී ලංකාවේ ආර්ථිකය



**ලංකාවේ ඇතිවී තිබෙන විනිමය අර්බුදය සමනය කළ නොහැකි මට්ටමට විශාල ආර්ථික අර්බුදයක් දක්වා වර්ධනය වෙමින් තිබේ. මේ අර්බුදයට තාවකාලික පිළියමක් ලෙස ආණ්ඩුව මේ මොහොතේ ආනයන සීමා කිරීමට පෙළැඹී සිටී. එය දැඩි ආනයන සීමා කිරීමක් දක්වා තල්ලු වෙමින් පවතී. එහෙත් මේ පවතින අර්බුදය ආනයන සීමා කිරීම මගින් විසඳා ගත හැකිද යන ප්‍රශ්නය කා අතරත් මතුවෙමින් පවතී. එය පසුගිය වසරවල ලංකාවේ ආනයන ව්‍යුහය අධ්‍යයනය කිරීමෙන් අවබෝධ කරගත හැක.**

| **මුළු ආනයන - එ.ජ.ඩො.මි.** | | |
|---|---|---|
| කාර්තුව | 2020 | 2021 |
| ජන - මාර්තු | 4,502 | 5,042 |
| අප්‍රේල් - ජුනි | 3,172 | 4,973 |
| ජුලි - සැප් | 4,108 | 4,923 |
| ඔක් - දෙසැ | 4,274 | 5,700 |
| | 16,056 | 20,638 |

ඉහත වගුවට අනුව 2020 වර්ෂයට වඩා 2021 වසරේ ආනයන වියදම ඩොලර් මිලියන 4,582 න් ඉහළ ගොස් ඇත. එය 2020ට වඩා 28%ක ඉහළ යාමකි. මෙලෙස ආනයන වියදම ඉහළ යාමට බොහෝ හේතු ඇති අතර එයට ප්‍රධාන හේතුවක් බවට පත්ව ඇත්තේ කෘෂිකාර්මික සහ කාර්මික යන අංශ දෙකෙහිම නිෂ්පාදනයේ කඩාවැටීමයි.

තවද ශ්‍රී ලංකාවේ ආනයනවල කුමන භාණ්ඩ වර්ග අන්තර්ගතද යන්න පහත සටහනින් අවබෝධ කරගත හැක.

| **ශ්‍රී ලංකාවේ ආනයන සංයුතිය - 2021** | | |
|---|---|---|
| වර්ගීකරණය | එ. ජ . ඩොලර් මිලියන | ප්‍රතිශතය |
| නිෂ්පාදිත භාණ්ඩ | 5,976.8 | 28.96 |
| යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 3,876.0 | 18.78 |
| ඛනිජමය ඉන්ධන , ලිහිසි ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය | 3,742.9 | 18.13 |
| ආහාර සහ සජීවී සතුන් | 2,275.2 | 11.02 |
| රසායනික ද්‍රව්‍ය සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන | 2,847.9 | 13.79 |
| විවිද නිෂ්පාදන උපාංග | 953.3 | 4.61 |
| ඉන්ධන හැර ආහාරයට නුසුදුසු සකස් නොකළ ද්‍රව්‍ය | 584.7 | 2.83 |
| සත්ව හා එළවලු තෙල් සහ මේද වර්ග | 285.2 | 1.38 |
| පාන වර්ග සහ දුම්කොළ | 76.8 | 0.37 |
| වෙනත් වර්ග නොකළ | 18.5 | 0.08 |
| එකතුව | 20,638 | 100 |

ඉහත වර්ගීකරණයට අනුව ආහාර වර්ග ආනයන සම්පූර්ණයෙන් නතරකලද ලංකාවට ඉතිරි කරගත හැක්කේ දළවශයෙන් ඩොලර් මිලියන 2,200 ක් පමණි. එය කිසිසෙත් කල නොහැකි කාර්යයකි. ඉන්පසු ඇති ඉතිරි සියල්ලම පාහේ ආර්ථිකය නඩත්තුවට අත්‍යවශ්‍ය ආනයන භාණ්ඩය. පවතින අර්බුදයේ විශාලත්වයට සාපේක්ෂව ආනයන සීමා කිරීම පමණක් විසඳුමක් වන්නේ නැත.

| **මුළු අපනයන - එ.ජ.ඩො.මි.** | | |
|---|---|---|
| කාර්තුව | 2020 | 2021 |
| ජන - මාර්තු | 2,650 | 2,970 |
| අප්‍රේල් - ජුනි | 1,763 | 2,717 |
| ජුලි - සැප් | 3,032 | 3,235 |
| ඔක් - දෙසැ | 2,602 | 3,567 |
| එකතුව | 10,047 | 12,489 |

රජය විසින් 2021 වසරේ අපනයන ආදායම ඉහළ ගියා යයි උදම් ඇනුවද, ආනයන වියදම ඊට වඩා වැඩි වේගයකින් ඉහළ යාම නිසා වෙළෙඳ පරතරය 2020 වසරේ තිබූ එ.ජ. ඩො. මිලියන 6,109 පසුගිය වසරේ 8,149 දක්වා ඉහල ගොස් ඇත. මෙයට ණය වාරික සහ පොලී ගෙවීම ලෙස තවත් ඩොලර් මිලියන 7,000ක් එකතුවූ විට ඩොලර් මිලියන 15,000ක පමණ අවශ්‍යතාවයක් ඇති අතර ඒ සඳහා විදේශීය ප්‍රේෂණ ලෙස ඩොලර් මිලියන 6,000ක් ලැබුණද, තවත් ඩොලර් මිලියන 9,000ක හිඟයක් පවතී. ඒ අනුව 09.03.2022 දින ගැසට් නිවේදනයකින් ආහාර වර්ග ගණනාවක් ආනයනය සීමා කිරීම අතීසාරයට අමුඩ ගැසීමක් වැනිය.

| **වෙළඳ ශේෂය - ඩො.මිලියන** | | |
|---|---|---|
| | 2021 | 2020 |
| ආනයන | 20,638 | 16,056 |
| අපනයන | 12,489 | 10,047 |
| වෙළඳ ශේෂය | 8,149 | 6,009 |

# ඌව වෙල්ලස්සේ සිදුවන්නේ කුමක් ද?

**ඌව වෙල්ලස්ස ප්‍රදේශයේ අක්කර 65,000ක භූමි භාගයක උක් වගාව ආරම්භ කිරීමට සහ සීනි කර්මාන්තායතනයක් පිහිටුවීමට එරෙහිව නැවත වටයකින් පුළුල් ජනතා විරෝධයක් පැනනැඟී තිබේ. දැනට දශකයකටත් එහා සිට ක්‍රියාත්මක කිරීමට උත්සාහ කළ ද, පැනනැඟුණු විරෝධතා නිසා කල් දමමින් තිබූ මෙය නැවතත් කරළිගත වී තිබේ. මෙම ව්‍යාපෘතිය කුමක් ද යන්න සහ එය ක්‍රියාත්මක කළහොත් සිදුවන වාසි, අවාසි පිළිබඳවත් සාකච්ඡා කිරීම මෙම ලිපියේ අරමුණයි.**

### ආරම්භය

සීනි නිෂ්පාදන කර්මාන්තයක් ඇරඹීම වෙනුවෙන් බ්‍රිතාන්‍යයේ බූකර් ටේට් සමාග මේ නියෝජිත මයික් මොහොමඩ් 2005දී පමණ ලංකාවට පැමිණ ඒ සඳහා ශක්‍යතා අධ්‍යයනද සිදුකර ඇත. ඒ සඳහා ඔවුන් විසින් ඉඩම්ද හඳුනාගෙන තිබේ. පසුව මෙම සමාගම ලංකාවේ IMS Holdings හා එක්ව සීමාසහිත බිබිල සීනි සමාගම පිහිටුවා ගනු ලැබේ. ඒ සීනි නිෂ්පාදනයට සහ මද්‍යසාර ස්ප්‍රීතු නිෂ්පාදනය වෙනුවෙන් ඩොලර් මිලියන 150ක් ආයෝජනය කරන බව පවසමිනි. 2005 ඔක්තෝබර් 31 දින ප්‍රථම වරට එම සමාගම ඌව වෙල්ලස්ස ප්‍රදේශයේ නිල්ගල ඔසු උයන පිහිටි භූමියෙන් ඉඩම් ලබා දෙන ලෙස ඉල්ලීමක් ඉදිරිපත් කරන ලදී.

2006 අගෝස්තු 25 වන දින ආයෝජන පහසුකම් සැලැසීමේ අමාත්‍ය මණ්ඩල අනුකමිටුවේදී රිදීමාලියද්ද, මැදගම, බිබිල, කන්දකැටිය, ලුණුගල, පදියතලාව සහ මහියංගණ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල හෙක්ටයාර 23,000ක් පුරා උක් වගා කිරීමට යෝජනා කර ඇති අතර, කර්මාන්ත ශාලාව පිහිටුවීම සඳහා අක්කර 500ක් රජය විසින් ලබා දීමටත්, තවත් අමතරව අක්කර 7,500ක් කේන්ද්‍රීය ගොවිපළක් ලෙස වගා කිරීමටත් අනුමැතිය ලබා දී තිබේ. (මෙහි මුළු බිම් ප්‍රමාණය අක්කර 65,000කි.)

**පෙරකී අක්කර 500 සහ 7,500 සඳහා වන භූමියේ පාරිසරික බලපෑම් අගැයීම (EIA) සිදුකිරීම ශ්‍රී ලංකා ආණ්ඩුවේ වගකීම යටතේ සිදුනොකර ඉහතකී සමාගමටම පැවරීම සිදුවන අතර එය ශ්‍රී ලංකාවේ පවතින නීතියේ බරපතල අඩුවකි.** පසුව මෙම අමාත්‍ය මණ්ඩල අනුකමිටු තීරණය වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් 'ඌව වෙල්ලස්ස සීනි සංවර්ධන ව්‍යාපෘතිය' නමින්වූ කැබිනට් පත්‍රිකාවක් ලෙස කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කර ඇත. එයට 2006 දෙසැම්බර් 6 වන දින කැබිනට් මණ්ඩලයේ අනුමැතිය හිමිවිණි.

මුලින් රජයෙන් ලබාදීමට නියමිත අක්කර 8,000ක් සඳහා බිබිල නිල්ගල ඖෂධ වනයෙන්ද, දෙවනුව මැදගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි ගල්ඔය ජාතික වනෝද්‍යානයට අයත් භූමි කොටසක් හා එහි පෝෂක ප්‍රදේශයෙන්ද ඉල්ලා සිටියමුත් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව ඊට එකඟ නොවීය. පසුව රිදීමාලියද්ද දෙහිගම ප්‍රදේශයෙන් එය ලබාදීමට තීරණයවූ අතර පෙරකී කැබිනට් පත්‍රිකාවෙන් එයට අනුමැතිය ලබාදී ඇත. **ලංකාවේ එකම ස්ථානයක පිහිටි ස්වාභාවික කටුඋණ ශාක ප්‍රජාව, හෙක්ටයාර 80ක් පුරා මෙම භූමිය තුළ පැතිරී ඇත. ජනතාවගේ පෞද්ගලික ඉඩම් මෙන්ම වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් වටිනා ඖෂධ ගහන ස්වාභාවික වනාන්තරයක්ද මෙයට අයත්ය. නිතරම අලි ඇතුන් ගැවසෙන මෙම භූමිය මාදුරුඔයේ පෝෂිත ප්‍රදේශයකි.** මේවා ද ඇතුළු තවත් බොහෝ කරුණු නිසාම බදුල්ල දිසා වන නිලධාරියා මෙම ප්‍රදේශයෙන් ඉඩම් ලබාදීමට විරුද්ධව 2006 මාර්තු 21 වන දින කරුණු දක්වන ලදී. මේ ආදී හේතු නිසා යම් කාලයක් ඇදී ගියද, 2006 දෙසැම්බර් 19 දින ජනාධිපති කාර්යාලයේදී ජනාධිපතිවරයා සහ අදාළ ඇමැතිවරුද, ඉහළ නිලධාරීන් ද එක්වී උක්ත විරෝධතාවයට දෝෂාරෝපණය කරමින් බලහත්කාරී ලෙස ඉඩම් නිදහස් කිරීමට තීරණය කර ඇත. මේ සමඟ ඉඩම් නිදහස් කිරීමට බලාධිකාරය කටුතු කටයුතු කිරීමත් සමග එයට එරෙහිව ජනතා විරෝධය මතු විය. එහෙත් ව්‍යාපෘතිය ට යම් යම් සංශෝධන ගෙන එමින් 2008 මාර්තු 4, 2008 ඔක්තෝබර් 24 සහ 2009 සැප්තැම්බර් 09 යන දිනවල පැවැති කැබිනට් මණ්ඩල රැස්වීම්වලදී ඊට අදාළ අනුමැතීන් හිමිවී ඇත.

කොළඹ පිහිටි කාර්යාලවලට අමතරව බිබිල ප්‍රදේශයේදී මීට අදාළ සමාගමේ කාර්යාල විවෘතවූ අතර, දෙහිගම ප්‍රදේශයේ බීජ ගොවිපළක් ද ආරම්භ කෙරිණි. ව්‍යාපෘතියට අදාළ මූලික මැදිහත්වීම් සිදුකිරීමට උත්සාහ කිරීම්වලදී ඊට එරෙහිව ගොඩනැගුණු 'ඌව වෙල්ලස්ස ජන අයිතීන් සුරැකීමේ සංවිධානය' සමඟ ප්‍රදේශයේ ගොවීන් මෙන්ම ස්වේච්ඡා සංවිධාන, පරිසරවේදීන් ඇතුළු බොහෝ අය එක්වීම නිසා පුළුල් ජනතා විරෝධයක් මතුවූ අතර, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පසුපසට දැමීමට එවක පාලනයට සිදුවිය. ව්‍යාපෘති ආරම්භ කිරීමට උත්සාහ කර වසර පහක් ගත වුවද, එය ආරම්භ කිරීමට නොහැකිවීම හේතුවෙන් බූකර් ටේට් සමාගම ඉන් ඉවත්වූ අතර, IMS Holdings විසින් වෙනත් ආයෝජකයකු සොයා ගැනීමට උත්සාහ කළද, එයද අසාර්ථක විය. මේ නිසා යම් කාලයකට ව්‍යාපෘතිය යට ගියේය.

### දෙවන වටය

වසර පහකට පසු ආයෝජකයකු ලෙස කැඳවා ගැනුණේ චීනයේ සීමාසහිත ගුආන්ගෙ ාන්ඩ් ගුආනකන් සීනි සමූහ සමාගමයි. ඒ සමඟම 2005 අප්‍රේල් 01 දින අමාත්‍ය මණ්ඩල සන්දේශයක් ඉදිරිපත් වුණු අතර, 2005 අප්‍රේල් 22 දින ඊට අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමිවිය. පසුව චීන සමාගම ව්‍යාපෘතියෙන් ඉවත්වූ අතර, ඒ වෙනුවට සිංගප්පූරුවේ සීමාසහිත ගැසල් වෙනචර්ස් පෞද්ගලික සමාගම ව්‍යාපෘතියට සම්බන්ධ විය. ඔවුන්ගේ ආයෝජනය එක්සත් ජනපද ඩොලර් මිලියන 152.25 කි. වාර්ෂිකව සීනි මෙට්‍රික් ටොන් 80,000ක් (ලංකාවේ වාර්ෂික අවශ්‍යතාවෙන් 14%කි.), මොලැසස් (Molasses) මෙට්‍රික් ටොන් 36,000ක්, සත්ව ආහාර මෙට්‍රික් ටොන් 40,000ක්, කාබනික පොහොර මෙට්‍රික් ටොන් 12,000ක් නිපදවිය හැකි බව ප්‍රකාශ විණි. මීට අමතරව කර්මාන්ත ශාලාවෙන් ඉවතලන උක් රොඩු (Bagasse) භාවිතයෙන් මෙගා වොට් 10ක හා ප්‍රදේශයෙන් ලබාගන්නා ග්ලිරිසීඩියා මඟින් මෙගාවොට් 10ක් ලෙස මෙගාවොට් 20ක විදුලිය නිපදවන බවද ප්‍රකාශිතය. මේ අතර ව්‍යාපෘතියේ භාරකාරීත්වය වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයට මාරු වීමද සිදුවිය.


රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දෙහිගම හා ඇකිරියන්කුඹුර ග්‍රාම නිලධාරි වසම්වලින් හෙක්ටයාර 149ක්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය මඟින් වසර තුනක සහන කාලයක් සහිත වසර 33ක වාණිජ බදු පදනම මත සීනි කර්මාන්ත ශාලාව හා විදුලි බලාගාරය සඳහා සීමාසහිත බිබිල සීනි කර්මාන්ත සමාගම වෙත දීර්ඝකාලීන බදු යටතේ ලබාදීමට යෝජනා කෙරිණි. ඒ වනවිට අනවසරයෙන් මහවැලි ඉඩම් භුක්තිවිඳින ගොවීන්ගෙන් එක් අයකුට උක් වගාව පමණක් කිරීමේ පදනම යටතේ වසර පහක කාලයකට ඉඩම් හෙක්ටයාර දෙකක් බදු පදනම මත ලබා දීමට යෝජනා විය. එම යෝජනාද ඇතුළත් කැබිනට් පත්‍රිකාව 2017 ජනවාරි 20 දින එවක මහවැලි සංවර්ධන හා පරිසර ඇමැති මෛත්‍රීපාල සිරිසේන කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කළ අතර , එයට 2017 පෙබරවාරි 14 වන දින කැබිනට් අනුමැතිය ලැබිණි.

ඒ අනුව ක්‍රියාත්මකවූ මහවැලි අධිකාරිය ඇතුළු අදාළ ආයතන විසින් ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු ආරම්භ කරන ලදී. ඒ අනුව නැවත වටයකින් විරෝධතා මතුවීමද සිදුවිය. කර්මාන්ත ශාලාව සඳහා යෝජිත හෙක්ටයාර 149 තුළ සිටින ගොවීන් සඳහා නෙරපීමේ නියෝග නිකුත් කෙරුණු අතර, ඊට එරෙහිව ඔවුහු අධිකරණයේ නඩු පැවරූහ.

ඒ හේතුවෙන් ව්‍යාපෘතිය ඉදිරියට යාම තාවකාලිකව පසුපසට තල්ලු විය. ඒ සමඟ පැමිණි මැතිවරණ ක්‍රියාවලිය සහ ආණ්ඩුමාරු කාලසීමාව නව ක්‍රියාමාර්ග නොගැනිණි.


මැතිවරණ සමය තුළ සහ ඉන් පසුවද වත්මන් පාලකයන්ගේ පොරොන්දුව වූයේ මෙය ක්‍රියාත්මක නොකරන බවයි. වරෙක 'ගම සමඟ පිළිසඳර' වැඩසටහනකදී ජනාධිපතිවරයා මුණගැසුණු ගොවීන්ට එම ඉඩම්වල වැවිලි කටයුතු කරන ලෙසද ඔහුගෙන් උපදෙස් ලැබිණි. නමුත්, සත්‍යය නම් ඩොලර් හිඟයකද සිටි ආණ්ඩුව මෙම ව්‍යාපෘතිය නවතා දැමීමේ කිසිදු අදහසක

7 පිටුවට





# නූතන මානවයා ලොව පුරා පැතිරීම සහ පරිණාමය පිළිබඳ ජාන තාක්ෂණය ඇසුරින් කළ සොයාගැනීම්

**මිනිසාගේ පරිණාමය සහ ලොව පුරා ජනාවාසකරණය පිළිබඳ මතවාද ගොඩනැගීම සඳහා දශක ගණනාවක් තිස්සේ මූලික වශයෙන් භාවිතා කරන ලද්දේ පොසිල සාක්ෂිය. එහිදී ශරීරයේ විශාලත්වය සහ හැඩය, අස්ථි පද්ධතියේ සහ දත්වල ලක්ෂණ විසින් මිනිසාගේ සම්භවය පිළිබඳ තොරතුරු රැසක් අනාවරණය කරන ලදී. මීට අමතරව ආදි මිනිසා භාවිත කරන ලද අවි ආයුධ, මෙවලම් මෙන්ම අනෙකුත් සංස්කෘතික නිමවුම් ද ලොව පුරා මානව වර්ගයා පැතිර යාම පිළිබඳ රහස් නිරාවරණය කර ගැනීමට බෙහෙවින් ඉවහල් විය.**




1980 දශකයේ අග භාගයේදී මෙම සොයා ගැනීම් සඳහා නව මංපෙතක් විවර වූයේ ජාන තාක්ෂණයේ වර්ධනයත් සමගය. ඒ අනුව ආදි මානව පොසිල තුළින් ඒවායේ DNA ලබාගනිමින් ඒවා විකේතනය කිරීම ආරම්භවූ අතර, 1987 කාලයේ පටන් මානව පරිණාමය පිළිබඳ වැදගත් කරුණු ගණනාවක් අනාවරණය කරගැනීමට ඒ අනුව හැකියාව ලැබිණි.




එක්සත් ජනපදයේ බාර්ක්ලේ, කැලිෆෝනියා විශ්වවිද්‍යාලයේ විද්‍යාඥයන් පිරිසක් මේ පිළිබඳ පරීක්ෂණ කිරීමේ නිරත වූ අතර ඒ සඳහා ඔවුන් විසින් ලොව පුරා විසිර සිටින ජනතාවගේ ජාන ලක්ෂණ පරීක්ෂාවට භාජනය කරන ලදී. එහිදී ඔවුන් විසින් අවධානය යොමුකරන ලද්දේ එම ජාන අතර පවතින මයිටොකොන්ඩ්‍රියන් DNA (Mitochondrion DNA) කෙරෙහිය. මෙම මයිටොකොන්ඩ්‍රියන් DNA දරුවන්ට ලැබෙන්නේ ඔවුන්ගේ මව්වරුන්ගෙන් වන අතර ඒවා කලවම් වීමකින් තොරව පරම්පරාවෙන් පරම්පරාවට ගමන් කරනු ලබයි. එම නිසා වසර දහස් ගණනක මවුවරුන්ගේ පාරම්පරික සම්බන්ධතාව මෙම මයිටොකොන්ඩ්‍රියන් DNA තුළ ගැබ්ව ඇත.

ඒ අනුව පරීක්ෂණ කරගෙන යාමේදී විද්‍යාඥයන් දුටු වැදගත් ලක්ෂණයක් වූයේ මෙම මයිටොකොන්ඩ්‍රියන් DNA විවිධත්වය වැඩිම වන්නේ අප්‍රිකානු කලාපය තුළ බවයි. එසේම මෙම ජාන ලක්ෂණ පදනම් කරගනිමින් විද්‍යාඥයන් පවුල් ගසක් නිර්මාණය කළ අතර, එහි ප්‍රධාන ශාඛා දෙකක් දක්නට ලැබිණි. ඉන් එකක් හරහා ලොව පුරා සෑම රටකටම (අප්‍රිකාවද ඇතුළත්ව) අතු පැතිර තිබූ අතර අනෙක් ශාඛාව පැතිර තිබුණේ අප්‍රිකානු කලාපය තුළ පමණි. ඒ අනුව පෙනීගියේ අම්මාවරුන්ගේ පාරම්පරික පෙළගැස්ම අප්‍රිකාව වෙත දිවෙන බවයි.

මයිටොකොන්ඩ්‍රියන් ෘහ් වෙනස්වීම් සඳහා ගතවන කාල පරාසය හා සංසන්දනාත්මකව මෙම පෙළගැස්ම සකස් කළ විට පෙනීගියේ මෙම මූලාරම්භය වසර ලක්ෂ 2ක පමණ ඉතිහාසයක් දක්වා දිවෙන බවයි. එනම් වසර ලක්ෂ 2කට පෙර අප්‍රිකානු කලාපයේ සිටි හෝමෝ සේපියන් මානවයාගෙන් වර්තමානයේ ලොව පුරා වෙසෙන සියලු දෙනා පැවත එන බව ඔවුන් විසින් නිගමනය කර තිබිණි. එහෙත් සමහර විද්‍යාඥයන් මෙම මතය සමග එකඟ නොවූ අතර ඔවුන් ප්‍රකාශ කළේ අප්‍රිකානු සම්භවයක් සහිත පිරිස විශාල වීමක් නිසාද මෙවැනි ප්‍රතිඵල ලැබිය හැකි බවත් එමගින් තවත් කුඩා කණ්ඩායම් හරහාද මානව කොටස් පැවතගෙන ආ හැකි බව ඉන් නිෂේධනය නොවන බවත් ය. එසේම මයිටොකොන්ඩ්‍රියන් DNA හරහා ජාන උරුමය පිළිබඳ 100%ක් නිවැරදි අදහසක් ඉදිරිපත් කළ නොහැකි බවත් ඔවුන් විසින් පවසන ලදී.

වසරින් වසර නව තාක්ෂණික හැකියාවන් වර්ධනයත් සමග කාල නිරණය කිරීම් සහ වෙනත් පරීක්ෂණ හරහා වඩ වඩාත් දත්ත එකතුවූ අතර ඒවා මගින් තව තවත් තහවුරු වූයේ අප්‍රිකාව තුළ මානව පරිණාමය සිදුව මානවයා ලොව පුරා පැතිර ඇති බවයි. 2003 වසරේදී ඉතියෝපියාව ආශ්‍රිතව වසර 1,95,000 - 1,60,000 අතර අතීතයේ සිටි හෝමෝ සේපියන් මානවයාගේ පොසිල කොටස් හමුවීමත් පසුකලෙක දළ වශයෙන් වසර 3,00,000ක් පමණ පැරණි හෝමෝ සේපියන් පොසිල මොරොක්කෝවෙන් හමුවීමත් හෝමෝ සේපියන් මානවයාගේ ඉතිහාසය සම්බන්ධ අධ්‍යයනයන් වැඩිදියුණු කිරීමට දායකත්වය සැපයීය.

1997දී ජාන විද්‍යාඥ ස්වාන්ට් පාබෝ ප්‍රමුඛ කණ්ඩායමක් විසින් නියැන්ඩර්තාල් මානව පොසිල කොටස් හරහා ලබා ගත් මයිටොකොන්ඩ්‍රියන් DNA සාම්පල පරීක්ෂාවට ලක් කළ අතර එහිදී හඳුනා ගන්නා ලද්දේ ඒවා නූතන මානවයාගේ මයිටොකොන්ඩ්‍රියන් DNA වලට වඩා බොහෝ සෙයින් වෙනස් බවයි. ඒ අනුව නියැන්ඩර්තාල් මානවයා වෙන්ව පැවැති මානව විශේෂයක් බවට නිගමනය විය. දශකයකට පමණ පසු ඔහු ඇතුළු කණ්ඩායම නියැන්ඩර්තාල් මානවයාගේ සමස්ත ජාන ලක්ෂණ නූතන මානවයාගේ සමස්ත ජාන ලක්ෂණ සමග සංසන්දනය කරන ලදී. එහිදී හෙළි වූයේ අප්‍රිකානු කලාපයෙන් පිටත, විශේෂයෙන් යුරෝපයේ සහ ආසියාවේ සමස්ත මානව ජාන තුළ නියැන්ඩර්තාල් ජාන ලක්ෂණ 1%ත් 4%ත් අතර ප්‍රමාණයකින් පවතින බවයි. එමගින් තහවුරු වන්නේ අපගේ ආදීතමයන් අප්‍රිකාවෙන් පැවත එන්නන් වන බවත්, අප්‍රිකාවෙන් පිටත කලාපවල පැතිරීමේදී සුළු වශයෙන් වෙනත් මානව වර්ග සමග මිශ්‍ර වී ඇති බවත් වේ. පසුකාලීනව පෘතුගාලයෙන් හමුවූ ආදි මානව ඇටසැකිල්ලක හෝමෝ සේපියන් සහ නියැන්ඩර්තාල් මානව ලක්ෂණ දෙකෙහිම සම්මිශ්‍රණයක් සහිත ජාන ලක්ෂණ දක්නට ලැබිණි.

සයිබීරියාවේ ඩෙනිසෝවා ගල්ගුහාව ආශ්‍රිත කැණීම්වලදී ලැබුණු ඇඟිල්ලක අස්ථි කොටසක් පරීක්ෂා කළ පැබෝ ඇතුළු කණ්ඩායම නිරීක්ෂණය කළේ එහි ජාන ලක්ෂණ හෝමෝ සේපියන් සහ නියැන්ඩර්තාල් යන වර්ග දෙකටම හාත්පසින් වෙනස් බවය. ඒ හා සමකාලීනව හෝමෝ සේපියන් සහ නියැන්ඩර්තාල් යන වර්ග දෙකම එම ප්‍රදේශය ආශ්‍රිතව වාසය කර තිබුණද මෙය තවත් මානව විශේෂයක් විය. ඔවුන් ඩෙනිසෝවන් (Denisovan) මානව වර්ගය ලෙස නම් කල අතර මෙම මානව වර්ගයට අයත් තවත් පොසිල කොටස් සුළු ප්‍රමාණයක් පසුකාලීනව සොයා ගැනීමට විද්‍යාඥයන් සමත්ව ඇත. ඩෙනිසෝවන් මානව වර්ගයේ ජාන සමස්ත ලක්ෂණ හෝමෝ සේපියන් මානවයාගේ සමස්ත ජාන ලක්ෂණ සමග සංසන්දනය කල විට සුළු වශයෙන් සමානකම් පෙන්වා ඇත්තේ එම මානව වර්ගයද පසුකාලීනව යම්තාක් දුරට නූතන මානවයා සමග මිශ්‍ර වී ඇති බව පෙන්වා දෙමිනි. නිදසුනක් ලෙස නිරිත දිග පැසිෆික් දූපත් වාසීන්ගේ සමස්ත ජාන ලක්ෂණ ඩෙනිසෝවන් මානවයාගේ ජාන ලක්ෂණ සමග 2%ත් 4%ත් අතර ප්‍රමාණයකින් සමාන කමක් පෙන්නුම් කරයි.

අද ලොව පුරා වෙසෙන සෑම මිනිසකුගේම පොදු පූර්වජයින් අප්‍රිකාවෙන් පැවත එන බවත් එක් කාලකදී වෙනත් මානව වර්ග සමග මිශ්‍රව, පරිණාමය වෙමින් ලොව පුරා පැතිර ඇති බවත් පැහැදිලිය. සමේ, ඇසේ හෝ කෙස්වල වර්ණයේ මෙන්ම හැඩරුවේ කොතෙක් වෙනස්කම් තිබුණද සමස්ත ලොවපුරා පැතිර ඇත්තේ එකම මානව වර්ගයක් බව ජාන තාක්ෂණය ද තහවුරු කර ඇත.

# ශ්‍රී ලංකාවේ ආර්ථික හා දේශපා

**ආර්ථිකය තුළ විදෙස් බලපෑම**

**1948 පෙබරවාරි 04 දින ඩොමිනියන් තත්ත්වයේ දේශපාලන නිදහසක් ලැබූ ශ්‍රී ලංකාව එයින් වසර 74කට පසුවද අධිරාජ්‍යවාදී රටවල, මූල්‍ය ආයතනයන්හි සහ කලාපීය බලවතුන්ගේ ආර්ථික ග්‍රහණයන්ගෙන් මිදීමට සමත්ව් නැතුවා පමණක් නොව තව තවත් එම ග්‍රහණයන්ට නතු වෙමින් සිටියි. ඇතැම් කාලයක බලහත්කාරී ස්වරූපයෙන් පැමිණි මෙබඳු ආර්ථික මැදිහත්වීම් මෑතකාලීනව රට මුහුණ දී ඇති ආර්ථික අර්බුදය හමුවේ ස්වකැමැත්තෙන් සිදුවන නතුවීම් ස්වරූපයෙන් ක්‍රියාත්මකය. මෙම සිදුවීම් දාමය ඓතිහාසිකව මෙසේ විමසා බැලිය හැකිය.**

- **1950 අගෝස්තු 29 - ශ්‍රී ලංකාව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සාමාජිකත්වය ලැබීම**

- **1952 දෙසැම්බර් 18 - චීනය සමග රබර්- සහල් ගිවිසුම අත්සන් තැබීම.**

සමාජවාදී චීනය සමග අත්සන් තබන ලද මෙම ගිවිසුම එවකට ඩඩ්ලි සේනානායක ආණ්ඩුවේ එක්සත් ජනපද ගැති ප්‍රතිපත්තියට එරෙහිව යාමක් ලෙස පෙනී ගියද, ඒ වන විට කොරියානු යුද්ධය හමාර වීමත් සමග ලංකාවේ ස්වාභාවික රබර් වෙළෙඳපොළ කඩාවැටීම හේතුවෙන් ඇතිවූ විදෙස් විනිමය හිඟය හමුවේ දේශපාලන කඳවුරු භේදයකින් තොරව සිදුවූ තෝරා ගැනීමකි.

- **1975 - ආසියා පැසිෆික් වෙළෙඳ ගිවිසුම** (APTA - **බැංකොක් ගිවිසුම)**

බංගලාදේශය, චීනය, ඉන්දියාව, ලාඕසය, දකුණු කොරියාව සහ ශ්‍රී ලංකාව යන සාමාජික රටවල් අතර මෙම ගිවිසුම 2005දී නැවත අලුත්කොට අත්සන් තබන ලදී.

- **1993 අප්‍රේල් - සාර්ක් වරණීය වෙළෙඳ ගිවිසුම** (SAPTA)

සාර්ක් සාමාජික රටවල් වන බංගලාදේශය, භූතානය, ඉන්දියාව, මාලදිවයින, නේපාලය, පකිස්ථානය සහ ශ්‍රී ලංකාව අතර වරණීය වෙළඳ කලාපයක් ඇති කිරීමේ අරමුණින් දකා හි අත්සන් තබන ලදී. 2006දී SAFTA ගිවිසුම අත්සන් කිරීමට සමග මෙහි වැදගත්කම අහෝසි විය.

- **1998 - ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම (ISFTA)**

මෙම ගිවිසුමෙහි ඇතුළත් භාණ්ඩ හුවමාරුවට අමතරව සේවා හුවමාරුව සහ තවත් ක්ෂේත්‍ර කිහිපයක් ආවරණය වන පරිදි ශ්‍රී ලංකාව, ඉන්දියාව අතර නව විස්තීර්ණ ආර්ථික සහයෝගිතා ගිවිසුමක් (CEPA) අත්සන් කිරීමට උත්සාහ දරන ලද නමුත් මහජන විරෝධය හේතුවෙන් එය හකුළා ගන්නා ලදී.

- **2000 - ගෝලීය වරණීය වෙළෙඳ ක්‍රමය** (GSTP)

G77 සාමාජික රටවල් විසින් ආරම්භ කරන ලද මෙම ගිවිසුම අනුව ඊට අත්සන් තබන ලද රටවල් අතර ආනයන අපනයන කිරීමේදී බලපාන්නා වූ තීරු බදු සහන ප්‍රකාශයට පත් කර ඇත.

- **2002 ජූලි 25 - වෙළෙඳ හා ආයෝජන රාමුගත ගිවිසුම (TIFA) ඇමරිකා එක්සත් ජනපදය හා ශ්‍රී ලංකාව අතර වොෂින්ටනයේදී අත්සන් තැබීම.**

ශ්‍රී ලංකාවේ අපනයන කරන ලබන ප්‍රධානතම රට ලෙස එක්සත් ජනපදය හිමි කරගෙන ඇති තත්ත්වය සහ ශ්‍රී ලංකාවට වාසිදායක වෙළඳ ශේෂය පාවිච්චි කරගනිමින් ලංකාවට බලපෑම් කිරීමේ හැකියාව වැඩි කර ගැනීම මෙහි අරමුණය.

- **2003 පෙබරවාරි - ත්‍රීමලය තෙල් ටැංකි ඉන්දියානු තෙල් සමාගමට පැවරීමේ ගිවිසුම i.**

රනිල් වික්‍රමසිංහ අගමැතිවරයාගේ ආණ්ඩුව ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් විකිණීම, බෙදාහැරීම හා ගබඩාකිරීමට අවසර ලබා දීම සම්බන්ධයෙන් වන ගිවිසුමක් ඉන්දියානු තෙල් සමාගම සමග අත්සන් කරන ලද අතර ඒ සමග ත්‍රිකුණාමලය තෙල් ටැංකි පද්ධතිය වසර 35කට බදු දීමේ ගිවිසුමද අත්සන් කරන ලදී. ඒ අනුව පිරවුම්හල් 100ක්, තෙල් ගබඩා සංකීර්ණයෙන් (CPSTL) 1/3ක් සහ ත්‍රීමලේ ටැංකි 14ක් ඔවුනට පැවරිණි. ඉන්දියාව තෙල් ටැංකි බදු මුදල් වාර්ෂිකව ගෙවා තෙල් ටැංකි පාවිච්චි කර ගෙන ආ නමුත් මාස 06ක් ඇතුළත ඛනිජ තෙල් සංස්ථාව සමග විධිමත් ගිවිසුමක් අත්සන් කරන බවට මුල් ගිවිසුමේ සඳහන් වුවද එසේ නොකර නීති විරෝධීව මෙම තත්වය පවත්වා ගෙන එන ලදී.

- **2005 ජුනි - පාකිස්ථානු - ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම** (PSFTA)

පාකිස්ථානය හා ශ්‍රී ලංකාව අතර බදු රහිත නිෂ්පාදන ආනයන හා අපනයන සඳහා මෙයින් පහසුකම් සලසයි.

- **2005 - සාමාන්‍ය වරණීය වෙළෙඳ ක්‍රමය (Generalised System of Preferences GSP +) ජීඑස්පී ප්ලස්**

1970 ගණන්වල මුල් භාගයේ සිට ශ්‍රී ලංකාවද ඇතුළු අඩු දියුණු රටවලට වරප්‍රසාදයක් ලෙස දියුණු රටවල් විසින් ලබා දුන් තීරු බදු සහන පිළිවෙතට (GSP) අමතර දිගුවක් කරමින් යුරෝපා සංගමය විසින් ලබා දුන් තීරු බදු මුළුමනින්ම ඉවත් කිරීමේ විශේෂ සහනයයි. මේ යටතේ ශ්‍රී ලංකාවද ඇතුළු රටවල් 49කට ඇඟළුම්, මත්ස්‍ය නිෂ්පාදන ඇතුළු අපනයන බදු රහිතව යුරෝපා සංගමයට අපනයනය කිරීමේ අවස්ථාව ලැබෙන අතර 2005-2010 කාලයෙන් පසු ලංකාවට අදාළව මෙම සහනය 2010දී ඉවත් කරන ලද්දේ මානව හිමිකම් කඩකිරීමේ චෝදනාව සමගය. නැවත 2017දී මෙම සහනය සක්‍රීය කරන ලද අතර බලපෑම් කිරීමේ අවියක් ලෙස අදටද පාවිච්චි කරනු ලබයි.

- **2006 ජූනි - දකුණු ආසියානු නිදහස් වෙළෙඳ ගිවිසුම** (SAFTA)

රටවල් අතර බදු රහිත නිෂ්පාදන ආනයන හා අපනයන සඳහා දකුණු ආසියානු සාමාජික රටවලට අවස්ථාව ලැබිණි.

- **2006 ඔක්තෝබර් - ඉන්දියාව වෙනුවෙන් ත්‍රිකුණාමලයේ විශේෂ ආර්ථික කලාපයක් ප්‍රකාශයට පත් කිරීම**

ඔක්තෝබර් 16 දින නිකුත් වූ 1467/03 අති විශේෂ ගැසට් පත්‍රයක් මගින් ත්‍රිකුණාමල වරාය අවට ප්‍රදේශයෙන් සාම්පූර්ද ඇතුළත්ව ග්‍රාම නිලධාරි වසම් 04කට අදාළ වර්ග කි.මී. 679ක් විශේෂ ආර්ථික කලාපයක් ලෙස නම් කරන ලද අතර එය සාම්පූර් බලාග ාරය සමග ඉන්දියාවට පැවරීමට නියමිත විය. කෙසේ වුවද පාරිසරික හේතු මත බලාගාරය ඉදිකිරීම තහනම් කරන ලද්දෙන් මීට අදාළ කටයුතු ඉදිරියට ගියේ නැත.

- **2008 ජූලි - මන්නාරම තෙල් ගවේෂණ බිම් කොටස ඉන්දියානු කායින් සමාගමට පැවරීම.**

මන්නාරම් ද්‍රෝණියේ තෝරා ගන්නා ලද 001 තෙල් බිම් කොටසේ ගවේෂණ කටයුතු ඉන්දියාවට (Cairn India Limited) පවරන ලදී. (ගවේෂණ වෙනුවෙන් පවරන ලද එකම බිම් කොටස එයය) මේ සඳහා එම සමාගම සමග ඛනිජතෙල් සංවර්ධන අධිකාරිය විසින් 2008 ජුලි 07වැනි දින ගිවිසුම් අත්සන් තබන ලදී. පසුව මෙම සමාගම සිදු කරන ලද ගවේෂණ ප්‍රතිඵල ලෙස එහි තෙල් කැණීම වාණිජ වශයෙන් වාසිදායක නොවන බව ප්‍රකාශ කළෙන් වෙනත් කිසිදු ගවේෂණ සමාගමක් ඒ වෙනුවෙන් ඉදිරිපත් නොවීය. කෙසේ වුවද ඉන්දියාව මන්නාරම ද්‍රෝණියට ආසන්න තම රටට අයත් කාවේරි ද්‍රෝණියෙන් අඛණ්ඩව තෙල් ලබා ගනිමින් සිටී.

- **2009 ජූලි - ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් ඩො.බි. 2.6ක ණය මුදලක් ලබා ගැනීම**

මීට අදාළ කොන්දේසි යටතේ ආණ්ඩුව අයවැය හිඟය ද.ජා.නි. 7%සිට 5% දක්වා අඩු කිරීමටද. බදු පදනම් පුළුල් කිරීමද, වියදම් කප්පාදු කිරීමද - පොහොර මිටිය රු. 350 සිට රු.1200 කිරීම, සමෘද්ධි සහන ඇතුළු සහනාධාර කප්පාදුව, භාණ්ඩ හා සේවා මිල ඉහළ දැමීම, අධ්‍යාපන හා සෞඛ්‍ය අරමුල් කප්පාදුව - ප්‍රාග්ධන ගිණුම විවෘත කිරීමටද, මහජන සම්පත් විකිණීම වේගවත් කිරීමද - කල්පිටිය දූපත් විකිණීම - සිදු කළ යුතු විය.

- **2010 ජුනි - ජනාධිපතිවරයාගේ ඉන්දියානු සංචාරය සමග අත්සන් තැබුණු ගිවිසුම්**

ජුනි 08-11 කාලය තුළ සිදු වූ මහින්ද ජනාධිපතිවරයාගේ ඉන්දියානු සංචාරය හා සමගාමීව ආර්ථික, සංස්කෘතික හා දේශපාලන ගිවිසුම් 17කට අත්සන් තැබිණි. මෙහි ආර්ථික බලපෑම් ලෙස ඉන්දියාව ඩො.මි. 800ක ණයක් ලබා දුන් අතර කොන්දේසි ලෙස මැදවච්චිය-තලෙයිමන්නාරම දුම්රිය මාර්ගය නවීකරණය, ඕමන්ත-පලෙයි දුම්රිය සංඥා පද්ධතිය ඉදිකිරීම, පලෙයි-කන්කසන්තුරේ දුම්රිය මාර්ගය නවීකරණය, ගාල්ල-මාතර අධිවේගී දුම්රිය මාර්ගය ඉදිකිරීම, සාම්පූර් ගල්අඟුරු බලාගාරය (පාරිසරික බලපෑම් හේතුවෙන් අධිකරණයෙන් තහනම් කෙරිණි) ඉදිකිරීම ඉන්දියාවට පවරනු ලැබිණි.

# ලන ක්ෂේත්‍ර තුළ විදෙස් බලපෑම

**• 2011 මැයි - විදේශ අමාත්‍යවරයාගේ ඉන්දියානු සංචාරය සමග අත්සන් තැබුණු ගිවිසුම්**

මැයි 15-17 කාලය තුළ සිදු වූ ජී.එල්. පීරිස් විදේශ අමාත්‍යවරයාගේ ඉන්දියානු සංචාරය අතරතුර අත්සන් තැබුණු ගිවිසුම් අතරද ආර්ථික මැදිහත්වීම් ගණනාවක් තිබිණි. කන්කසන්තුරේ වරාය, පලාලි ගුවන්තොටුපළ අලුත්වැඩියාව ඉන්දියාවට පැවරිණි.

**• 2014 සැප්තැම්බර් - චයිනා හාබර් සමාගමට අයත් පෝට් සිටි ව්‍යාපෘතිය ඇරඹීම**

චයිනා හාබර් ඉන්ජිනියරින් සමාගම විසින් ස්වකැමැත්තෙන් ඉදිරිපත් කරන ලද පෝට් සිටි ව්‍යාපෘතිය චීනයේ එක් තීරයක් එක් මාවතක් වැඩසටහනේ කොටසකි. මෙහි වැඩ ආරම්භ වූයේ 2014 සැප්තැම්බර් 17 දිනය. ඒ අනුව කොළඹ නගරයට යාබදව මුහුද ගොඩකර හෙක්ටයාර 269ක කෘත්‍රිම භූමියක් තනන ලදී. 2021 මැයි මාසයේ සම්මත කරන ලද පෝට් සිටි පනත මගින් මෙහි විශේෂ ආර්ථික කලාපයක් ප්‍රකාශයට පත් කර වෙනම නීති පද්ධතියක්ද ස්ථාපිත කර දෙනු ලැබීය.

**• 2018 ජනවාරි - සිංගප්පූරු - ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම (SSLFTA)**

ගිවිසුමේ අන්තර්ගතය භාණ්ඩ, සේවා, ආයෝජන, විදුලි සංදේශ, විද්‍යුත් වෙළෙඳාම ඇතුළු පුළුල් ක්ෂේත්‍රයක විහිද පැවැති අතර භාණ්ඩ 3537කට අදාළ දෙරට අතර තීරු බදු ඉවත් කෙරිණි. කෙසේ වුවද මතුවූ විරෝධතා හේතුවෙන් සේවා ක්ෂේත්‍රයේ ප්‍රවේශයට පැවති සීමා ඉවත් කිරීමක් සිදු වූයේ නැත.

**• 2021 සැප්තැම්බර් - කොළඹ වරායේ බටහිර පර්යන්තය ඉන්දියානු අදානි සමාගමට පැවරීම**

ශ්‍රී ලංකාවට පැමිණි අදානි සමාගමේ සභාපතිවරයා සැප්තැම්බර් 30වැනි දින ශ්‍රී ලංකාවේ වරාය අධිකාරියේ සභාපතිවරයා සමග වසර 35ක කාලයක් වෙනුවෙන් කොළඹ වරායේ බටහිර ජැටිය ඉදිකර පවත්වා ගෙන යාම වෙනුවෙන් ගිවිසුම් අත්සන් කළේය.

• 2021 සැප්තැම්බර් - යුගදනවි බලාගාරය ඇමරිකානු ෆෝට්‍රස් එනර්ජි සමාගමට පැවරීම

සැප්තැම්බර් 17වැනි දින මධ්‍යම රාත්‍රියේ නිව් ෆෝට්‍රස් එනර්ජි සභාපති සහ භාණ්ඩාගාර ලේකම්වරයා අතර ඊට අදාළව සකසන ලද ගිවිසුම අත්සන් තැබිණි. කෙරවලපිටිය යුගදනවි බලාගාරයේ 40% ක අයිතියත්, වසර 05කට එල්එන්ජී ගෑස් සැපයුමේ අයිතියත්, කෙරවලපිටිය ප්‍රදේශයේ ඉදිවිය හැකි වෙනත් ඕනෑම බලාගාරයක් සඳහා ගෑස් සැපයීමේ අයිතියත් ඇතුළු තවත් අවසරයන් ටෙන්ඩරයකින් තොරව සැප්තැම්බර් 06 දින කැබිනට් අනුමැතියෙන් ඇමරිකානු ෆෝට්‍රස් එනර්ජි සමාගමට පවරා තිබේ.

• 2022 ජනවාරි - ත්‍රිකුණාමලය තෙල් ටැංකි ඉන්දියානු තෙල් සමාගමට පැවරීමේ ගිවිසුම ii

ජනවාරි 06වැනි දින ඛනිජ තෙල් සංස්ථාව සහ ඉන්දියානු තෙල් සමාගම අතර ගිවිසුමක් අත්සන් තැබුණේ තෙල් ටැංකි 99න් 61කට අදාළව ඒකාබද්ධ සමාගමක් පිහිටුවීම පිළිබඳවය. එහිම කොටසක් ලෙස ටැංකි 24ක් ඛනිජ තෙල් සංස්ථාවට පැවරීමද මේ දක්වා ෂඩක සමාගම විසින් පාවිච්චි කරගෙන ආ තෙල් ටැංකි 14 තවත් වසර 50කට ඔවුන් වෙත පවරා දීමද සිදුවිය.

# ශ්‍රී ලංකාව සම්බන්ධ ආරක්ෂක ගිවිසුම්

ලෝකය පුරා දේශපාලන බලය වෙනුවෙන් තම තමන්ගේ ආරක්ෂාව තහවුරු කරගැනීමට සියලු බලගතු රාජ්‍යයන් කටයුතු කරන අතර දුර්වල රාජ්‍යන් ඒවායේ ගොදුරු හෝ ඉත්තන් බවට පත්වේ. මෙවැනි දේශපාලන බලය තහවුරු කරගැනීම සම්බන්ධයෙන් ලොව ප්‍රධාන රාජ්‍ය බවට පත්වී ඇත්තේ එක්සත් ජනපදයයි. දේශපාලන බලය වෙනුවෙන් එසේ ක්‍රියාත්මකවන ගිවිසුම් ප්‍රධාන වශයෙන් කොටස් 03 ට බෙදා දැක්විය හැක.

**1. සිවිල් ආරක්ෂක ගිවිසුම් - Security Agreements**

මේ යටතේ රටවල අතර යම් සිවිල් ආරක්ෂාව සම්බන්ධයෙන් විවිධ ගිවිසුම් වලට එළඹේ. ඒවායින් සාමාන්‍ය ආරක්ෂාව සම්බන්ධව කටයුතු කරනු ලබන අතර සමහර ත්‍රස්තවාදී කටයුතු නතර කරගැනීම වෙනුවෙන් එවැනි ගිවිසුම් වලට එළඹේ. මෙවැනි වර්ගයේ ගිවිසුමකට එක්සත් අරාබි එමීර් රාජ්‍ය සහ ශ්‍රී ලංකාව අතර අත්සන් කිරීමට පසුගිය දෙසැම්බර් මාසයේ දී එක්සත් අරාබි එමීර් රාජ්‍යයේදී එහි රාජ්‍ය අමාත්‍ය බින් අලි අල් සායෙත් සහ මහජන ආරක්ෂක අමාත්‍ය සරත් වීරසේකර අතර සාකච්චාවක් පවත්වා ඇත. එහි අරමුණ වී ඇත්තේ කලාපීය ආරක්ෂාව ගැන සැලකිලිමත් වීමත් තලෙයිබාන් සංවිධානය මගින් ඇතිවිය හැකි අනතුරු දායක තත්වයන් වලක්වා ගැනීමත්ය. එම ගිවිසුම ද්වීපාර්ශ්වික ආරක්ෂක සහයෝගීතා ගිවිසුම (Bilateral Security Cooperation Agreement) නමින් ක්‍රියාත්මක වීමට නියමිතය.

**2. යුදමය ගිවිසුම් - Military Agreements**

යුද ගිවිසුම් වලට එළඹෙන්නේ අදාල රට සමග සෘජුවම යුදමය තත්වයන් සඳහා මැදිහත් වීමටය.

**3. ආරක්ෂක ගිවිසුම් - Defence Agreements**

ඉහත සඳහන් සියලු ආකාරයේ ගිවිසුම් රටවල් වල දේශපාලන සහ ආරක්ෂක තත්වයන් වෙනුවෙන් මැදිහත් වේ. ආරක්ෂක ගිවිසුම් උපායමාර්ගික වශයෙන් වැදගත් ගිවිසුම් වර්ගයක් වන අතර, රටක ස්වෛරීත්වය සහ දේශපාලනය මේ සමග ගැට ගසා ගැනීමට බල-වත් රාජ්‍ය නිරන්තරයෙන් කටයුතු කරති. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ගත්කල ආරක්ෂක ගිවිසුම් ප්‍රධාන ලෙස අත්සන් කර ඇත්තේ එක්සත් ජනපදය සහ ඉන්දියාව සමගය.

**1. ඇක්සා ගිවිසුම - Acquisition of Cross Servicing Agreements**

ශ්‍රී ලංකාව සහ එක්සත් ජනපදය අතර 2007 මාර්තු මස මෙම ගිවිසුම අත්සන් කරන ලද අතර ශ්‍රී ලංකාව වෙනුවෙන් එවක ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතාත් , එක්සත් ජනපදය වෙනුවෙන් රොබට් බ්ලේක් මහතාත් අත්සන් කරන ලදී. මෙම ගිවිසුම මෙදිනේ සිට වසර 10 ක් බලාත්මක වන ආකාරයට පිළියෙළ කර තිබුණි. මෙම ගිවිසුමට අනුව මානුෂීය මෙහෙයුමකදී හෝ සම සාධක හමුදා මැදිහත්වීමකදී එම හමුදා මෙහෙයුම් කටයුතු සඳහා ආහාර පාන , තෙල් සහ ප්‍රවාහන පහසුකම් අදාළ රටෙන් ලබා ගත හැක. ඒ අනුව ශ්‍රී ලංකාව එක්සත් ජනපදය ආසන්න රටක් සමග යුද්දයකදී මෙම පහසුකම් ලබා ගත හැක. එක්සත් ජනපදය මෙවැනි ගිවිසුම් රටවල් 89 ක් සමග අත්සන් කර ඇත.

**2. සෝෆා ගිවිසුම - Status of Force Agreements**

SOFA ගිවිසුම ACSA ගිවිසුමට සාපේක්ෂව අප රටෙහි ස්වෛරීත්වය කෙරෙහි බලපෑම් ඇති කරයි. එහි ඇති සමහර කොන්දේසි අප වැනි කුඩා රටකට ඉතා අවාසි සහගත වේ. මෙම ගිවිසුම 1995 මැයි මස 16 දින එක්සත් ජනපදය සහ ශ්‍රී ලංකාව අතර අත්සන් කරන ලදී. එහි ඇති සමහරක් කොන්දේසි අප රටෙහි ස්වෛරීත්වයට බලපෑම් කර තිබේ.

1. මෙම ගිවිසුම යටතේ එක්සත් ජනපද හමුදා නිලධාරීන්ට ඕනෑම මොහොතක ශ්‍රී ලංකාවට අතුලුවියහැකි අතර ඒ සඳහා ඔවුන්ගේ හැඳුනුම් පත පමණක් ප්‍රමාණවත් වේ. වීසා බලපත් අවශ්‍ය නොවේ.

2. එක්සත් ජනපද ආරක්ෂක නිලධාරීන්ට ලංකාව තුල රියදුරු බලපත්‍රයක් නොමැතිව රිය පැදවිය හැක.

7 පිටුවට

# රුසියානු හා යුක්රේන් යුද ගැටුම

**යුක්‍රේනය සහ රුසියාව අතර ඇති වී තිබෙන යුද ගැටුම නිසා යුක්‍රේනය අද ලෝකයේම අවධානයට යොමුව තිබේ. යුක්‍රේනය යනු නැගෙනහිර යුරෝපයේ පිහිටි රාජ්‍යයක් වන අතර එය වර්ග කිලෝමීටර් 6,03,628ක් පමණ විශාල වන අතර ජනගහනය මිලියන 43ක් පමණ වේ. රුසියාවට යාබදව පිහිටි රාජ්‍යයක් වන එය බෙලරුසියාව, පෝලන්තය, ස්ලොවැකියාව, හංගේරියාව, රුමේනියාව සහ මෝල්ඩාවියාව යන රටවලින් වට වී ඇත.**




මෙහි ජනගහණයෙන් 77.8% යුක්රේනියන්වරු වන අතර 17.3% රුසියානු ජාතිකයන්ය. 4.9% වෙනත් ජනවර්ගවලට අයත් වේ.

1917 ට පෙර සාර් රුසියාව විසින් ඈදාගෙන තිබූ රටක් වන යුක්‍රේනය 1917 පෙබරවාරි රුසියානු විප්ලවයෙන් පසු යුක්‍රේනියානු මහජන සමූහාණ්ඩුව ලෙස ස්වාධීන රටක් බවට පත් වෙයි. පසුව 1922 එය සෝවියට් සමූහාණ්ඩු සංගමයට එක් වේ. සෝවියට් සංගමය බිඳවැටීමෙන් පසු 1991 එය නැවත වෙනම රටක් බවට පත් වේ. සෝවියට් පාලන කාලය තුළ එය ඉතා ඉහළ කාර්මික රටක් බවට පත්ව තිබුණි.

කෙසේ වෙතත් මේ වනවිට යුක්‍රේනය යුරෝපයේ දුප්පත්ම රටවලින් එකක් ලෙස සැලකෙන අතර එය සංවර්ධනය වෙමින් පවතින රටක් ලෙස වර්ගීකරණය වී ඇත. කෙසේ වෙතත් ඉතා සරු භූමියකින් සමන්විත රටක් වන බැවින් ලෝකයේ විශාලම ධාන්‍ය අපනයන කරුවෙකු වේ. ලෝකයේ තිරිඟු අපනයනයෙන් පස්වන ස්ථානයේ පසුවන්නේ යුක්‍රේනයයි. එමෙන්ම ඉතා හොඳ යපස් නිධි සහිත රටකි. ඒ මත පදනම්ව යකඩ සහ වානේ යුක්‍රේනයේ ප්‍රධාන කර්මාන්තයක්ව ඇත. ගල් අඟුරු, ඛනිජ තෙල්, ස්වභාවික ගෑස්, මැංගනීස් ආදී ඛනිජ වර්ග රාශියක්ද යුක්‍රේනයේ ස්වභාවික සම්පත් අතර වේ.

■ ලෝකයේ ප්‍රධාන ධාන්‍ය නිෂ්පාදකයකු සහ අපනයනකරුවකු වීම.

■ තෙල්, ගල් අඟුරු, ස්වභාවික ගෑස් ඇතුලු ස්වභාවික සම්පත් වලින් ගහන ප්‍රදේශයක් වීම.

■ රුසියානු දේශ සීමාව සහ යුරෝපය මැදි කරගත් භූ දේශපාලනික පිහිටීම යන මූලික කරුණු නිසා යුක්‍රේනය ලෝක ආර්ථික හා දේශපාලනික ක්‍රියාදාමයේදී සංවේදී කලාපයක් බවට පත්ව ඇත.

මේ වනවිට නැවතත් ලෝක ආර්ථික-දේශපාලනයේ ප්‍රභලයෙකු බවට පත්ව සිටින රුසියාවට තම ආරක්ෂාව සම්බන්ධ කාරණාවේදී යුක්‍රේනයේ දේශපාලනය ඉතා වැදගත් වන අතර, තම බලය ව්‍යාප්ත කරමින් සිටින ඇමරිකා එක්සත් ජනපදය ප්‍රමුඛ නේටෝවටද තම ආර්ථික දේශපාලනයේදී රුසියානු භූමියට ආසන්න වීම සඳහා යුක්රේනය ඉතා වැදගත්ව ඇත. පසුගිය කාලයේ දේශපාලනය නිරීක්ෂණය කරන විට රුසියාවේ සහ නේටෝවේ යුක්‍රේනය සම්බන්ධ දේශපාලන හැසිරීම මෙම පදනමින් සිදු වීය.

1991 යුක්‍රේනය රුසියාවෙන් ඉවත් වූවත් එහි පැවති පාලනය 1994 දක්වාම රුසියානු හිතවාදී එකක් විය. එහෙත් එය මධ්‍යස්ථ රටක් වශයෙන් ප්‍රකාශයට පත් කොට තිබුණි. රුසියාව සමඟ මෙන්ම යුරෝපය සහ නේටෝව සමගත් සම්බන්ධතා පවත්වන ලදී. නමුත් 1913 දී එරට ජනාධිපති වික්ටර් යනුකොවිච් විසින් යුක්‍රේන-යුරෝපීය සංගමයේ සහයෝගීතා ගිවිසුමෙන් ඉවත්ව වඩා රුසියානු හිතවාදී පිළිවෙතකට ගමන් කිරීමට උත්සහ ගන්නා ලදී. කෙසේ වෙතත් යුක්‍රේනයේ බලයේ සිටි රුසියානු හිතවාදී පාලනය ඒ වන විට අන්ත දූෂිතභාවයේ ගිලී තිබුණි. එමෙන්ම රට බරපතල ආර්ථික අර්බුධයකට මුහුණ පා තිබුණි.

මෙම තත්වය පාවිච්චි කරමින් ඇමරිකා එක්සත් ජනපදය යුක්රේනය තුල තමන්ට හිතවත් පිරිසක් අතට පාලනය ලබාදීම සඳහා කුමන්ත්‍රණකාරී මැදිහත්වීමක් සිදු කරන ලදී. යුක්‍රේනය තුල පැවති ආණ්ඩුවට එරෙහි මහජන පෙළඹවීමක් ඇති කරන ලද අතර එය ,ැමරදප්සා්බ, නැගිටීම වශයෙන් හැඳින්වේ. ැමරදප්සා්බ නැගිටීමෙන් පැවති රුසියානු හිතවාදී පාලන තන්ත්‍රය බිඳ වැටුණු අතර ඇමරිකානු හිතවාදී කණ්ඩායමක් බලයට පත් වීය. ඔවුන්ගේ දේශපාලන පසුබිම අන්ත ජාතිවාදී සහ නාසිවාදී එකක් විය. රුසියානු භාෂාව ඉගැන්වීම තහනම් කරමින්, රුසියානු සංස්කෘතිකාංග තහනම් කරමින් සහ විනාශ කරමින්, බොල්ෂෙවික්වරුන්ගේ සොහොන් කඩා දමමින් රුසියාව සමඟ වූ දේශපාලන ආර්ථික සබඳතා බිඳ දමමින් ඍජු ඇමරිකන් ගැති නේටෝ හිතවාදී ප්‍රතිපත්තියක් මෙම නව පාලකයින් අනුගමනය කරනු ලැබුවා.

මේ සමඟම රුසියාව සහ යුක්‍රේනය අතර දේශපාලනික සබඳතාවය ගැටුම්කාරී එකක් බවට පත් වන්නට විය.

2014 මාර්තු මාසයේදී රුසියාව විසින් ක්‍රිමියාව අත්පත් කරගන්නා ලදී. ඒ වන විට යුක්‍රේනයට අයත්ව තිබුණද එය සෝවියට් දේශය පැවති කාලයේදී යුක්‍රේනයට පවරා දෙන ලද රුසියානු භූමියකි. රුසියාව විසින් ක්‍රිමියාව අත්පත් කරගනු ලැබුවේ ජනමත විචාරණයක් මගිනි. ජනමත විචාරණයේදී රුසියාව සමඟ එකතු වීමට කැමති බවට 97% ක කැමැත්තක් ලැබුණි.

ැමරදප්සා්බ නැගිටීමට පසු පසින් ඩොනෙස්ට්සක් සහ ලුහාන්සක් ප්‍රදේශ පදනම් කරගත් රුසියානු ජන කොටස් ජීවත් වන ප්‍රදේශවල යුක්‍රේනයෙන් වෙන් වීම සඳහා වන නැගිටීමක් 2014 අප්‍රේල් සිදුවූ අතර එයට රුසියානු සහය ලැබුණි. එය ඩොන්බාස් යුද්ධය (ෘදබ්ශ් අ්ර) ලෙස හැඳින්වේ. යුක්‍රේන පාලකයින් විසින් රුසියානු ජන කොටස් වලට ඇතිකරන ලද අසාධාරණ සැලකීම, පීඩණය මෙම නැගිටීමට පදනම සැපයීය.

මේ අතර නේටෝව විසින් ක්‍රමාණුකූලව සෝවියට දේශය බිඳවැටීමෙන් පසු රුසියානු භූමිය වට කරමින් තව තවත් රටවල් නේටෝවට බඳවා ගනිමින් සිටියහ.

1999 - චෙක් ජනරජය, හංගේරියාව, පෝලන්තය

2004 - බල්ගේරියාව, එස්තෝනියාව, ලැට්වියාව, ලිතුවේනියාව, රුමේනියාව, ස්ලොවැකියාව, ස්ලෝවේනියාව

2009 - ඇල්බේනියාව, ක්‍රොයේෂියාව

ආදී රුසියාව වටකරගත් පැරණි සෝවියට් දේශයේ පැවති සහ සමාජවාදී රාජ්‍යයන් නේටෝව තම සංවිධානයේ සාමාජිකයන් ලෙස බඳවා ගනු ලැබුවා.

මෙම තත්වය දිගින් දිගටම රුසියානු දේශපාලනය තුල ආතතියක් ඇති කරනු ලැබීය. නේටෝව යුක්‍රේනයට ඇතුලුවීම රුසියානු දේශසීමාවටම පා තැබීමක් වන අතර එවැනි තත්වයන් උසුලා සිටීමට තව දුරටත් රුසියානු දේශපාලනයට නොහැටි විය. ඒ බව ඇමරිකා එක්සත් ජනපදය ප්‍රමුඛ නේටෝව ඉතා හොඳින් දන්නා අතර මෙය හිතාමතාම රුසියාව ප්‍රකෝප කරමින් යුක්‍රේනය සහ රුසියාව යුද්ධයකට ඇද දැමීමක් ලෙස සැලකිය හැකිය.

නේටෝව සම්බන්ධයෙන් දැඩි විශ්වාසයක් තබමින් යුක්‍රේන පාලකයින්ද රුසියානු විරෝධී, ඇමරිකානු-නේටෝ හිතවාදී ප්‍රතිපත්තිය තුල ඉදිරියට ගමන් කිරීමට උත්සහ දරණ අතර 2022 පෙබරවාරි 24 දින රුසියානු හමුදා යුක්‍රේනයට කඩා වදින ලදී.

සමාජවාදය පැවති සමයේ සෝවියට් සංගමයේ 7 පිටුවට

## ඌව වෙල්ලස්සේ .....

02 පිටුවෙන්

නොසිටි බවයි. පසුව අධිකරණය තුළ ගොවීන් පැවරූ නඩු පැරදීමත් සමඟ නැවත නෙරපීමේ නියෝග රැගත් මහවැලි අධිකාරිය ඉදිරි කටයුතු ක්‍රියාත්මක කිරීමත් සමග අලුත් වටයකින් විරෝධතා මතුවී තිබේ. එම ඉඩම්වල අස්වනු නෙළීමට ආසන්න බෝග සියල්ල විනාශ කරමින් ඩෝසර් දමා බිම සකස් කිරීමට මහවැලි අධිකාරිය සහ සමාගම පසුගියදා කටයුතු කිරීමත් සමඟ ප්‍රතිවිරෝධතා වඩා උත්සන්න විය. අද වන විට මානව හිමිකම් කොමිසමට පෙත්සම් ඉදිරිපත් කරමින් ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් නඩු ගොනු කරමින් ප්‍රදේශවාසීන් ඇතුළු ජනතාව දැනුම්වත් කරමින්, ඌව වෙල්ලස්ස ජන අයිතීන් සුරැකීමේ පෙරමුණ විසින් මීට එරෙහි පුළුල් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරමින් සිටී.

**ව්‍යාපෘතියේ වාසි අවාසි**

දැනටමත් ලංකාවේ උක් කර්මාන්ත බිම් හතරක් පවතී. ඒවා නම් හිඟුරාණ, කන්තලේ, සෙවණගල සහ පැල්වත්තයි. හිඟුරාණ සහ කන්තලේ කර්මාන්ත රජය විසින් ආරම්භ කළ අතර, පසුව කුණුකොල්ලයට පෞද්ගලික අංශයට විකුණා දැමිණි. අද වන විට ඒවා වසා දමා ඇත. එම සමාගම්කරුවන් ඒවායේ සාරය උරා බී රොඩු ජනතාවට දමා ගොස් ඇත. හිඟුරාණේ අක්කර දොළොස්දාහක් පමණද, කන්තලේ අක්කර 25,000ක් පමණද වගාබිම් අද වන විට අත්හැර දැමූ බිම් බවට පත්වී තිබේ. වගා කළ ගොවීහුද, ඒවායේ රැකියා කළ සේවකයෝද දැනට වසර ගණනාවක සිට අතරමං වී අර්බුද ගණනාවක ගිලී සිටිති. දැනටත් සීනි නිපදවන සෙවණගල හා පැල්වත්ත කර්මාන්ත පෞද්ගලික අංශය විසින් පවත්වාගෙන යයි. පාරිසරික ප්‍රශ්න, සෞඛ්‍ය ප්‍රශ්න ඇතුළු ගැටලු ගණනාවක් ඒවායේද දිගින්දිගටම පැනනැගී ඇත. වන අලි නිසා විටෙක වගාද, තවත් විටෙක වන අලින්ද විනාශ වෙමින් පවතී.

ඉහත කී කර්මාන්ත සඳහා ලබා දෙනු ලැබූයේ වාරි ජලයයි. නමුත්, ඌව වෙල්ලස්ස ප්‍රදේශයේ වැසි ජලයෙන් උක් වගා කිරීමට යෝජනා කරයි. දැනටමත් නිසි කලට වැසි නොලැබීම නිසා නියඟයට හසුවී වගා හානිවලට ලක්වන මේ ප්‍රදේශයේ උක් වගාව වැසි ජලයෙන් සාර්ථකව වගා කළ නොහැකි බව ඉතා පැහැදිලිය. උක් යනු වැඩි ජල ප්‍රමාණයක් උරා ගනු ලබන, අහසින් වැටෙන වැඩි ජල ප්‍රමාණයක් පොළොවේ රඳවා තබාගත නොහැකි ශාකයකි. අනෙක් පැත්තෙන් මේ ප්‍රදේශයේ සාර්ථක ලෙස වගා කළ හැකි බෝග බොහොමයකි. දැනටමත් විශාල වශයෙන් ලංකාවට ගෙන්වීමට විදේශ විනිමය වැය කරන දොඩම් සඳහා බිබිල ප්‍රදේශය නම් දරා ඇත. මීට අමතරව කෙසෙල්, අන්නාසි, පැපොල්, ගම්මිරිස්, බුලත්, පොල්, රබර් වැනි දෑ සාර්ථක ලෙස දැනටමත් වගා කෙරේ. අතිරේක වශයෙන් බඩඉරිඟු, කුරක්කන්, තල, මෙනේරි ආදියද වගා කළ හැකිය. සීනි වෙනුවට කිතුල් වගාවද මේ ප්‍රදේශයේ සාර්ථකව කළ හැකි අතර, කිතුල් පැණි සහ කිතුල් හකුරු සඳහා දේශීයව මෙන්ම විදේශීයවද හොඳ ඉල්ලුමක් පවතී.

දැනටමත් සිදු කරන වගාවන් සඳහා අවශ්‍ය දිරිමත් කිරීම් කරමින් ඒවා විධිමත් කිරීමට කටයුතු කිරීම වෙනුවට මෙවැනි ව්‍යාපෘතිවලින් සිදුවන්නේ බරපතළ හානියකි. දැනට අතහැර දමා ඇති කන්තලේ සහ හිඟුරාණට අත්වූ ඉරණමම මෙයටද ඉක්මනින්ම අත්වන බව ඉතා පැහැදිලිය. තමන් ජීවත් වන බිමේම ගොවීන් කුලීකරුවන් කළ විට ඔවුන්ගේ ලාභ ශ්‍රමය මිලදී ගැනීමට සමාගම්වලට ඉතා පහසුය.

කර්මාන්තායතනය සඳහා යෝජිත භූමිය මාදුරුඔයේ පෝෂක ප්‍රදේශයක් වන බැවින්, පාරිසරික සමතුලිතතාවන්ට සිදුවන බලපෑම අතිමහත්ය. යෝජිත භූමියේ රක්ෂිත වනාන්තරද මෙමඟින් විනාශ වීම බරපතළ අපරාධයකි. දැනට තිබෙන මට්ටමට වඩා වන අලි ගැටලුවද වැඩිවීම අනිවාර්යයක් වනු ඇත.

පාරිසරික බලපෑම් අගැයීම් වාර්තාව (EIA) ලබාගෙන ඇත්තේ, රජයෙන් සමාගමට ලබා දෙන කර්මාන්තායතනය, බීජ ගොවිපළ, විදුලි බලාගාරය සහ සත්ව පාලනය සිදුකරනු ලබන හෙක්ටයාර 149.3ක් වන භූමි ප්‍රමාණයට පමණි. එයද සකස් කොට ඇත්තේ සමාගමට අවශ්‍ය වන පරිදි බව ප්‍රකාශ වේ. යෝජිත සමස්ත භූමි ප්‍රමාණය වන අක්කර 65,000 සඳහා ම පාරිසරික අගැයීම් බලපෑම් වාර්තාවක් සකස් කිරීම අනිවාර්යතාවක් වුවද, එය තවමත් සිදු කර නොමැත. කර්මාන්තායතනය සඳහා යෝජිත භූමියේ පුරාවිද්‍යා ස්ථානද පවතින බැවින්, ඒ සඳහා පුරාවිද්‍යා අගැයීම් වාර්තාවක් සකස් කිරීමට සමාගමට සිදු විය. එයද ව්‍යාපෘතියට බාධාවක් නොවන ලෙස සකස් කර ගත් එකකි.

සමාගම පවසන පරිදි ප්‍රදේශවාසීන්ට රැකියා අවස්ථා ලැබීම සීනි නිෂ්පාදනය හේතුවෙන් විදේශ විනිමය ඉතිරිවීම වැනි කරුණු සමඟ සංසන්දනය කරන කල ව්‍යාපෘතිය හේතුවෙන් සිදුවන අවාසි ප්‍රමාණය ඉතා වැඩි බව පැහැදිලි වේ.

## ශ්‍රී ලංකාව සම්බන්ධ ආරක්ෂක ගිවිසුම්...

05 පිටුවෙන්

3. රටට භාණ්ඩ ගෙන එනවිට සහ රටින් පිටට ගෙනයන විට ලංකාවේ බදු නීතීන් සහ රේගු නීතීන් අදාළ නොවන අතර ඒවාට අදාළ බලපත්‍රයන් හෝ පරීක්ෂා කිරීම් කල නොහැක.

ඉහත කරුණු වලට අමතරව තවත් කරුණු ගණනාවක් අප රටෙහි ස්වෛරීත්වයට අදාලව මෙම ගිවිසුමෙහි පවතී. මෙම ගිවිසුම කෙටුම්පත් කරනු ලබන්නේ එක්සත් ජනපදය වන අතර අපට ඇත්තේ එය අත්සන් කිරීමට පමණි.

**3. ඉන්දු ලංකා සාම ගිවිසුම - Indo Sri Lanka Peace Accord**

ඉන්දු ශ්‍රී ලංකා සාම ගිවිසුම ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර 1987 ජුලි 29 දින කොලඹදී අත්සන් කරන ලදී. එයට ඉන්දීය රජය වෙනුවෙන් අගමැති රජීව් ගාන්ධි මහතාත් ශ්‍රී ලංකාව වෙනුවෙන් ජනාධිපති JR . ජයවර්ධනත් අත්සන් තැබීය. එය මහත් ආන්දෝලනයට තුඩුදුන් ගිවිසුමක් වූ අතර එහි මතුපිට අරමුණ වූයේ එවකට පැවති යුද්දය අවසන් කිරීමය. එහෙත් ඒ හරහා 13 වන සංශෝධනය ඇතිවූ අතර බලය බෙදීම ඉලක්ක කරගත් පළාත් සභා පිහිටුවීම ඒ හරහා සිදුවිය. එම ගිවිසුමට අනුව ඉන්දීය හමුදාව ලංකාවට පැමිණි අතර LTTE සංවිධානය ඉන්දීය හමුදාවට ආයුධ බාරදීමට නියමිත විය. එහෙත් එය එලෙස සිදු නොවුණු අතර බඹෑ සංවිධානය තව දුරටත් සන්නද්ධ ක්‍රියාවලියෙහි නිරත විය.

**4. සහශ්‍ර අභියෝගතා සංස්ථා ප්‍රදානය - Millennium Challenges Corporation Agreement (MCCA)**

මෙම ගිවිසුම යටතේ ලංකාවේ ප්‍රවාහන යටිතල පහසුකම් සහ ඉඩම් පරිපාලනය ක්‍රමවත් කිරීමේ අරමුණින් වසර පහකට ඩොලර් මිලියන 480 ක ප්‍රදානයක් දෙන බවට සඳහන් වේ. එහෙත් මෙහි යටි අරමුණ මීට වඩා බොහෝ වෙනස් අතර එය පසුගිය කාලයේ දීර්ඝ ලෙස සාකච්චා කරන ලදී. කෙසේ වෙතත් මෙම ගිවිසුම ඇතිවූ මහජන විරෝධය හමුවේ තාවකාලිකව හකුලාගෙන ඇත.

## රුසියානු හා යුක්රේන්....

06 පිටුවෙන්

නායකයින් දෙදෙනෙක් වන නිකිතා කෘෂෙව් සහ ලියොනිඩ් බ්‍රෙෂ්වේ යුක්‍රේනයෙන් පැමිණි නායකයින්ය. සමාජවාදය යටතේ සංවර්ධනයත්, සහජීවනයත් හොඳින් පැවති මේ කාලාපය ධනවාදය විසින් අද වන විට යුධ ගැටුම් ඇවිලී යන කලාපයක් බවට පත් කොට ඇත. මෙම ගැටුම් තුන්වන ලෝක යුද්ධයක් දක්වා වුවද ඇදී යාමේ අනතුර ඇත. අද ධනවාදයට ලෝකය වෙත ලබාදිය හැක්කේ මේ විනාශකාරී යුධගැටුම් පමණි.

තම ආර්ථික වුවමනාවන් වෙනුවෙන් යුධ දේශපාලන ආධිපත්‍ය පතුරවමින් යන යුධවාදී ඇමරිකා නේටෝ පාර්ශවයද, තම පටු ජාතිකවාදී වුවමනාවන් වෙනුවෙන් ප්‍රදේශ ඈදාගනිමින් තම ආධිපත්‍ය පතුරවමින් ආධිපත්‍යවාදී යුධමය මැදිහත්වීමකට ඇතුලු වූ රුසියානු පාර්ශවයද, නාසිවාදී සහ ජාතිවාදී ස්ථාවරයක් දරමින් යුධමය තත්වයකට දේශපාලනය මෙහෙයවූ යුක්‍රේන පාර්ශවයද යන සියලුම පාර්ශවයන් මෙම ගැටුමේදී පාරිශුද්ද නොවේ. ප්‍රගතිශීලී මැදිහත්වීමක් මේ එක් පාර්ශවයක මැදිහත්වීමක්වත් හැඳින්විය නොහැක. ඇමරිකා-නේටෝ යුධමය මැදිහත් වීමට මෙන්ම පුටින් ප්‍රමුඛ රුසියාවේ යුක්‍රේන ආක්‍රමණය යන දෙකටම අප එක සේ විරුද්ධ විය යුතුය.

# අධිරාජ්‍යවාදය යනු කුමක් ද?

දහනව වැනි සියවස අවසානයේදී සහ විසිවැනි සියවස ආරම්භයේදී ධනවාදී සමාජයේ ආර්ථික ව්‍යුහය තුළ විශේෂ වෙනස්කම් සිදු විය. විද්‍යාත්මක හා තාක්‍ෂණික ක්ෂේත්‍රයේ අත්කර ගත් ජයග්‍රහණවල බලපෑම මත මෙම කාලසීමාව තුළදී කාර්මික ක්ෂේත්‍රයේ අංශ තුළ විශාල වර්ධනයක් පෙන්වනු ලැබීය. විශේෂයෙන් ලෝහ කර්මාන්තය තුළ මෙන්ම, අලුත් වර්ගයේ එන්ජින්, විදුලි මෝටරය වැනි දෑ තුළ සිදුවූ දියුණුව, ඉන්ධන නිෂ්පාදනය හා රසායනික ක්ෂේත්‍රය තුළද, විදුලි ඉංජිනේරු අංශය තුළද කැපීපෙනෙන වෙනස්කම් සිදු විය. ප්‍රවාහණය හා සන්නිවේදන මාධ්‍යවලද විශේෂ වර්ධනයක් ඇති විය. මේ සියල්ල මහා පරිමාණ ව්‍යාපාරවල විශාල වර්ධනයක් ඇති කිරීමට හේතු විය. බැර කර්මාන්තයෙහි විවිධවූ අංශ තුළ ජාලගත වර්ධනයක් පෙන්නුම් කළ අතර, එය විශේෂ තත්ත්වයක් විය. 1870 සිට 1900 කාලසීමාවේදී ලෝක ලෝහ නිෂ්පාදනය 56 ගුණයකින් වර්ධනය විය. ඉන්ධන නිෂ්පාදනය 25 ගුණයකින් වර්ධනයවූ අතර, ගල්අඟුරු නිෂ්පාදනය 3-5ත් අතර ගුණයකින් වර්ධනය විය. නිෂ්පාදනය කේන්ද්‍රගත වීම ශීඝ්‍රයෙන් සිදුවන්නට විය. ඒකාබද්ධ කොටස් හිමි සමාගම්ද බහුල විය. මේ සමගම එතෙක් පැවැති ධනේශ්වර ක්‍රමය, **එනම් තනි තනි ධනපතීන් අතර වන නිදහස් තරඟය ප්‍රධාන ලක්‍ෂණයවූ ධනපති ආර්ථික ක්‍රමය වෙනුවට ඒකාධිකාර බිහි විය.**

මෙම විශේෂ වෙනස්කම් සිදුවූ කාලපරිච්ඡේදය විස්තර කිරීම සඳහා 'අධිරාජ්‍යවාදය' යන වචනය භාවිත කරනු ලැබීය. ඉංග්‍රීසි ජාතික ආර්ථික විද්‍යාඥයකුවූ ජේ.ඒ. හොබ්සන් විසින් ලියන ලද 'අධිරාජ්‍යවාදය' නමැති පොත 1902දී ලන්ඩන්හි හා නිව්යෝක්හි පළ විය. ධනවාදය තුළ සිදුවූ මෙම විශේෂ වෙනස්කම් හා ඒ පිළිබඳවූ අර්ථනිරූපණ පිළිබඳ ගැඹුරු අධ්‍යයනයකින් පසු 'අධිරාජ්‍යවාදය **ධනපති ක්‍රමයේ ඉහළම අවධිය**' නමැති කෘතිය ලෙනින් විසින් 1916දී ලියනු ලැබීය. ඒ තුළින් 'අධිරාජ්‍යවාදය' ධනවාදයේ මුල් අවධියෙන් (නිදහස් ධනවාදයෙන්) වෙන් කර හඳුනාගත හැකි මූලික ලක්‍ෂණ 5ක් පෙන්වා දෙමින්, 'අධිරාජ්‍යවාදය' පිළිබඳ නිවැරැදි ආර්ථික හා දේශපාලන විවරණයක් ඉදිරිපත් කරනු ලැබිණි.

**ලෙනින් ඉදිරිපත් කළ අධිරාජ්‍යවාදයේ මූලික ලක්‍ෂණ:**

**1. නිෂ්පාදනය සංකේන්ද්‍රණය වීම සහ ඒකාධිකාර.**

**2. කාර්මික ප්‍රාග්ධනය හා බැංකු ප්‍රාග්ධනය සංයෝග වී මූල්‍ය ප්‍රාග්ධනය බිහි වීම හා මූල්‍ය කතිපයාධිපතිත්වයක් ඇති වීම.**


**3. භාණ්ඩ අපනයනය වෙනුවට ප්‍රාග ්ධන අපනයනය කිරීම වැදගත් ලක්‍ෂණයක් ලෙස ඇති වීම.**

**4. ජාත්‍යන්තර ඒකාධිකාරී ධනපති හවුල් සමාගම් පිහිටුවීම හා ලෝකය ඔවුන් අතර බෙදා ගැනීම.**

**5. විශාල ධනපති බලවතුන් අතර ලෝකය භෞතිකව බෙදා ගැනීම.**

නිදහස් තරඟය යටතේ පැවැති ධනවාදී න්‍යායයන් අභියෝගයට ලක් කෙරෙන නව තත්ත්වය අධිරාජ්‍යවාදය යටතේ නිදහස්කරණයේ වෙළෙඳපොළ ස්වරූපය යටපත් කරමින් වෙළෙඳපොළ පුළුල් වන අතරම ඉන් එක් ධනපති පිරිසක් ආර්ථිකයේ ඉහළම ප්‍රතිලාභ භුක්තිවිඳින අතර, තවත් ධනපති කොටසකට වෙළෙඳපොළෙන් ඉවත් වීමට සිදුවේ. මෙම නව තත්ත්වය ඇතිවනුයේ, වෙළෙඳපොළ මිල ක්‍රියාකාරීත්වය නිදහස් තරගය යටපත් කරමින් ක්‍රියාත්මක වීම හේතුවෙනි. පිරිසකගේ නිෂ්පාදනය කඩාවැටෙන අතර තවත් පිරිසකට ඒ වෙළෙඳපොළ කොටසද හිමි වෙමින් නිෂ්පාදනය පුළුල් කිරීමේ අවස්ථාවක් මේ නිසා උදා වීමෙන් නිෂ්පාදන සංකේන්ද්‍රණය සිදුවේ. ඒකාධිකාර යනු මහා පරිමාණයේ ව්‍යාපාරයක් හෝ ව්‍යාපාර සමූහයක එකතුවකි. ඒකාධිකාර තරගය අහෝසි කිරීම හෝ සීමා කිරීම හෝ මඟින් තමන්ගේ නිෂ්පාදනය සඳහා ඉහළ මිල තීරණය කිරීමෙන් ඒකාධිකාරී ලාභ ඉපැයීමේ හැකියාව ලබා ගනී. 1860 - 1870 අතර කාල පරාසය තුළ ඒකාධිකාර කළල අවස්ථාවෙන් ආරම්භ වී 1873 ආර්ථික අර්බුදයෙන් පසු එයට විසැඳුමක් ලෙස කාටල (Cartels)ද, පසුව සංගත (Syndicates) හා භාරය (Trust) ලෙසද, අවසානයේ සම්මේලය (Cencern) ලෙස ඉහළ මට්ටමට වර්ධනයවූ ඒකාධිකාර ආයතන ව්‍යුහයක් දක්වා වර්ධනය විය. **කෙටි නිර්වචනයකින්** හඳුන්වන්නේ නම්, 'අධිරාජ්‍යවාදය' යනු 'ඒකාධිකාරී ධනවාදයයි'.

ඉහත 2 වැනි කරුණේ මූල්‍ය කතිපයාධිපතිත්වයක් (අධිකතර මූල්‍ය බලයක් සහිත ඒ නිසාම දේශපාලනමය ලෙස බලවත්වූ ධනපතියන්ගේ කුඩා කණ්ඩායමක්) ගොඩනැඟීම හා 5 වැනි කරුණ මඟින් අධිරාජ්‍යවාදයේ දේශපාලන ස්වභාවය පෙන්නුම් කරනු ලබන අතර. අනෙකුත් කරුණු මඟින් එහි ආර්ථිකමය පැත්ත පිළිබිඹු වෙයි. 5 වැනි කරුණ වෙත වැඩි අවධානයක් යොමු කළහොත්, ඉන් කියැවෙන්නේ විශාල ධනපති බලවතුන් අතර ලෝකය භෞතිකව බෙදා වෙන් කරගෙන ඇති අතර, ධනපතීන් අතර තරගයේදී එය නැවත නැවතත් අලුත් වෙමින් පැවැතීමයි. තවදුරටත් ඒ තුළින් කියැවෙන්නේ, ප්‍රබල හා ධනවත් ජාතීන් විසින් දුබල ජාතීන් යටත් කර ගැනීම හා නැවත නැවතත් යටත් කර ගැනීමයි. ලෝක යුද්ධ මෙන්ම, අධිරාජ්‍යවාදී බලපෑමට යටත්වූ ගැති රාජ්‍යවල සමාජවාදය සඳහා වන නිර්ධන පන්ති ව්‍යාපාරවල උපායමාර්ගය අධිරාජ්‍ය විරෝධය සහ ජාතික විමුක්ති අරගලය සමඟ බැඳී පැවැතීම යථාර්ථයක් වන්නේද අධිරාජ්‍යවාදයේ මෙම ලක්‍ෂණය නිසාවෙනි.



"ඒකාධිකාර කතිපයාධිපත්‍යය, නිදහස සඳහා නොව ආධිපත්‍යය සඳහා අරගල කිරීම, ධනවත්ම හා වාඩත්ම බලවත් ජාතීන් අතළොස්සක් විසින් කුඩා හා දුර්වල ජාතීන් එන්න එන්නම වැඩි වන සංඛ්‍යාවක් සූරාකනු ලැබීම යන මේ සියල්ලෙන් අධිරාජ්‍යවාදයේ ස්වභාව නිරූපී ලක්‍ෂණ ජනිත වේ. ඒවා ගැන සලකා බලන කල අධිරාජ්‍යවාදය යනු පරපෝෂිතවාදී නැතහොත්, දිරාපත් වන ධනපති ක්‍රමය ලෙසට විස්තර කිරීමට අපට අනිවාර්යයෙන්ම සිදුවන්නේය."

ලෙනින්, තෝරාගත් කෘති, 4 වැනි වෙළුම, 160 වැනි පිටුව